# 2006 වසරේ ලග්න පලාපල

By:  Lakshman Abeykoon
Noble Park - Australia  Ph. +61 3 9548 1613
Web. http://jyotisha.00it.com



## මේෂ ලග්නය

### කලක සිට බලාපොරොත්තුව සිටි අදහසක් ඉෂ්ඨවේ

## ධනය

කලක සිට බලාපොරොත්තුව සිටි අදහසක් ඉෂ්ඨවේ වැඩි උත්සාහයක් නැතිවම මිල මුදල් ලාභද ලැබෙන්නට හේතුයි දේපල කටයුතුද ඇතිවිය හැක දේපල බෙදීම්ද අන්‍ය උරුමක් කාරයන් ඇතිවීම්ද දේපල පිලිබද ඔප්පු ලිවීම් ආදිය ඇතිවිමද මේ කාලයේ සිදුවිය හැක නය ගනුදෙනුවලින් වාසි හෝ ලාභ ලැබේ බලාපොරොත්තු ඉෂ්ට වේ ආදායම වැඩිවේ ලාභ ප්‍රයෝජන ලැබෙන කාලයක ජනවාරි පෙබරවාරි මාස හොදයි ˜ වර්ශය මැද භාගයේදී දේපල ස්ථානලාභ ලැබෙන්නටද ඉඩ ඇත නමුත් අගභාගය කරදර සහිතයි

## රැකී රක්ෂා

කරන කියන කටයුතු හෝ රැකිරක්ෂාවලින් බලාපොරොත්තු රහිත ලාභ ලැබේ දියුනුව ඇතිකරන කාලයකි විදේශ ගතවීමට බලාපොරොත්තුව සිටින අයටද ඒ සදහා පහසුකම් සැලසේ ගුරු මහදශා ඇති අයට හොදයි නමුත් අනිත් අයට පවතින අපල වලට බෝධිපූජා ආදිය නිතර කලේ නැතිනම් ඉහත හොද ප්‍රතිපල ලැබෙන අතරම රැකී රක්ෂාවල කරදරද හිතේ සාමය නැතිවිමද වෙහෙස ඇති දුර ගමන් යෙදීමද පවුලේ අයගෙන් ඈත්වීම හෝ පවුලේ කරදර ඇතිවීමද මවුපිය වැඩිහිටියන්ට කරදර ඇතිවීමද ලජ්ජා අවනම්බු වීදීමට සිදුවීමද වෙහෙස ඇති සතුටක් නැති ගමන් යාමට සිදුවීමද නිෂ්පල වූද වියදම් අධික වූද ගමන් බිමන් යාමට සිදුවේ ස්තාන හෝ කටයුතුද වෙනස්විය හැකිය කරගෙන ආ කටයුතු කඩාබිදවැටීමටහෝ ඒවාට හාධා සිදුවීමට හෝ පුලුවනරැකීරක්ෂාවල තත්වය පිරිහීමද වැනි අපලද වරින්වර ඇතිකරන් පරිස්සම් විය යුතු කාලයකි

## ගෘහ ජීවිතය

සාමාන්‍යයෙන් ගෙදර දොර වාසනාවනත කාලයකි මංගල යෝග දරු ශිෂ්‍ය ලාභාදිය ලැබේ සිතට කයට සැප එලවන සියලු දේ ලැබෙන කාලයකි සාමාන්‍යයෙන් දියුනුවටද ඉඩ තිබේ හොද ආහාරපාන වර්ගද වාහනද ලැබෙන්නට පුලුවන අනුමානයට කරන වැඩ සාර්තකවී දියුනුව ලැබේ විවාහ මංගල්‍ය වැනි ප්‍රීති උත්සව ඇතිවේ ජීවිතයේ එක් අමුතු උදාවක් ඇතිකරන කාලයකි

එසේ වුවත් **පවතින අපල වලට පිලියම් කලේ නැතිනම්** නිතර පාහේ කනගාටු දායක වූද සිත් තැවුල් කරන්නාවූද කටයුතු සිදුවේ ධන හානි වීමට ඉඩ තිබේ සතුරන් නිසා නිතරම සිතට භය සැක ඇතිකරන කාලයකි

## අධ්‍යාපනය

අලුත් දේ ඉගනීමට ලැබේ නමුත් විභාග වලට සුභ කාලයක් නොවේ

## සෞඛ්‍ය

කේතු භයවැන්නේ ගමන් කරන කාලයේදීශරීර සනීපය ඇතිවේ අසනීප ගති තිබුනේනම් ඒවායින් සුවය ලැබේ නමුත් වාත රෝග වැනි අසනීප වැලදීමට පුලුවන පවුලේ වැඩිහිටියෙකුටද ඉතා අපල දායක කාලයකි

## වෘෂභ ලග්නය

### ධන ලාභ ලැබේ

## ධනය

සෙනසුරු තුන් වැන්නේ ගමන්කරන කාලයේදී ධන ලාභ ලැබේ සිත ප්‍රීතිමත් කාලයකි දියුනුව ඇතිවේ බලාපොරොත්තු රහිත හදිසි මිලමුදල් ලාභ ලැබෙන්නටද පුලුවන රාහු හෝ සෙනසුරු දශා අතුරු දශා ඇති අයට හොදයි නමුත් ගුරු හෝ කේතු වැනි දශා අතුරුදශා ඇති අයට වියදම් අධික කාලයකි

## රැකී රක්ෂා

කරගෙන ආ කටයුතු මෙන්ම අමුතුවෙන් ආරම්භ කරන කටයුතු ද දියුනුවේ තත්වය උසස්වේ සතුරන්ගෙන් ජය ලැබේ තම බලය වැඩිවේ වාසනාවන්ත කාලයකි තම රැකීරක්ෂා තනතුරු ආදිය දියුනුවේ

## ගෘහ ජීවිතය

දේපල ලාභ ලැබේ අයිතිවාසිකම් ලැබේ උසස් අය හා ආශ්‍රය ඇතිවේ උසස් අයගෙන් උපකාරද ලැබේ අසනීප වලින් සුවය ලැබේ උත්සව වලට හෝ සමාගම් වලට ආරාධනා ලැබේ ලොකු ලාබ පවා ලැබෙන්නට ඉඩ තිබේ වාසනාවන්ත කාලයකි රැකීරක්ෂා වලින් උසස්වේ නම හොදවේ නම්බුව ලැබේ සමාජයෙහි තම තත්වය ඉහලයයි දියුනුව සදහා කරගෙන යන කටයුතු තවතවත් දියුනුවේ ආදායම වැඩිවේ අලුත් හිතමිතුරන් ඇතිවේ පවුලේ වැඩිදියුනුවද ඇතිවේ මංගල යෝගද ඇතිකරන කාලයකි වැදගත් ගමන් යාමට ලැබේ ඉඩම් හෝ ගෙවල් ලාභ

ලැබේ සැම උත්සාහයකින්ම ප්‍රතිපල ලැබෙන කාලයකි කලින් තිබුන තත්වයට වඩා දියුනුවට කටයුතු සැලසේ මිලමුදල් අතින් දියුනුවට පැමිනේ අලුත් ඇදුම් පැලදුම් හොද ආහාරපාන බඩුමුට්ටු ආදිය මිලදීගැනිමට ලැබේ ඉඩකඩම් වාහන ගෙවල්දොරවල් ආදිය ලැබෙන්නටද මංගල්‍ය කටයුතු ස්තිරවන්නට හෝ ඒවායේ යෙදෙන්නට ඒවාට සහභාගීවනනටද ඉඩ ලැබේ ˆ අලුත් මිත්‍රයන් නැදැයන් ලැබෙන්නටද පුලුවන උසස් අය සමග ආශ්‍රය කිරමටත් ඔවුන් සමග හිත මිත්‍රකම් පැවැත්වීමටත් අවස්තාව ලැබෙන්නට පුලුවන පවුලේ දියුනුවටද හේතුඇත සතුරන් ඊර්ෂියාකාරයින් ඇතිවේ

## අධ්‍යාපනය

ඉගන ගත්දෙයින් ප්‍රයෝජන ලැබියහැකි කාලයකි

## සෞඛ්‍ය

ශරිර සනීපයටද හේතුයි රාහු එකොලොස් වැන්නේ ගමන්කරන කාලයේදී ශරිර සනීපය ඇති කරයි ˆ නමුත් පවුලේ අයට හා දරුදැරියන්ට අසනීපාදී කරදර ඇතිකරන කාලයකි හදිසි අනතුරු වලින් ප්‍රවේසම් විය යුතුය ශරිරයේ තුවාල ඇතිකලහැකි කාලයකි

# මිතුන ලග්නය

## ලද පමනින් සතුටුවිමට පුරුදු විය යුතු කාලයකි

## ධනය

ශනි දෙවැන්නේ ගමන්කරන කාලය අපල දායකයි මේකාලයේදී අනුන්ගෙන් ධනය ලැබුනත් එය වැඩිකලක් පැවතීමට හෝ එයින් සතුටුවීමට සිදුනොවේ අදික වියදම් සහිත කාලයකි නිශ්පල දෙයට වියදම් වේ මුදල් රදන්නේ නැති කාලයකි ලැබෙන්නට තියෙන මුදල් පවා නොලැබේ සමහරවිට නය ගනුදෙනු වලටද බැදෙන්නට සිදුවේ ˆ ශනි දෙවැන්නේ ගමන්කරන කාලය අපල දායකයි මේකාලයේදී අනුන්ගෙන් ධනය ලැබුනත් එය වැඩිකලක් පැවතීමට හෝ එයින් සතුටුවීමට සිදුනොවේ අදික වියදම් සහිත කාලයකි නිශ්පල දෙයට වියදම් වේ මුදල් රදන්නේ නැති කාලයකි ලැබෙන්නට තියෙන මුදල් පවා නොලැබේ සමහරවිට නය ගනුදෙනු වලටද බැදෙන්නට සිදුවේ ධන හානියටද ඉඩ තිබෙන බැවින් වස්තුව ආරක්‍ෂාකර ගතයුතුයි

## රැකී රක්‍ෂා

රාහු දසවැන්නේ ගමන් කරන කාලයේදී උසස් අය හෝ තම සවාමියන් සමග හෝ වැඩ කරුවන් නැතිනම් තමා සමග වැඩ කරන අයගෙන් කරදර හා හිරි හැරද ඇතිවන්නට පුලුවනි අලුත් වැඩකට හෝ රක්‍සාවකට යාමටද සිදුවීමට පුලුවන කේලාම් ඕපදූප නිසා සිත් තැවුලු ඇතිවේ පවුලේ කරදර හිරිහැර අමනාපකම් ඇතිවේ නරක මිනිසුන්ගේ ආශ්‍රයට වැටේ නරක සිරිත්ද ඇතිවන්නට

පුලුවන තිබුන ගෞරව සැලකිලි නැතිවීයයි ඒ අතරම කරන යම්කිසි වැඩකින් සැනසීමක්ද ඇතිවිය හැක ලද පමනින් සතුටුවිමට පුරුදු විය යුතු කාලයකි

## ගෘහ ජීවිතය

පවුල් අවුල් වියවුලු අසමගිකම් ඇතිවේ පවුලේ අයට අපල කාලයකි හිතවත් ඥාතියෙකු ගැන කතගාටු දායක පුවතක් අසන්නටද සිදුවේ චෝදනා නින්දා අපහාස ලැබෙන්නට ඉඩ තිබෙන බැවින් කල්පනා කාරීව ක්‍රියාකල යුතු කාලයකි කෙසේනමුත් ශනි 2වැන්නෙන් යාමට පෙර නින්දාවක් හෝ ආරවුලක් ඇතිවේ වරදකරුවෙක් වේ දුක් කනගාටු කරදර ඇති අවාසනාවන්ත කාලයකි පහත් අයගේ ආශ්‍රය ඇතිවන හෝ සතුරන් ඇතිවන කාලයක ගෙදරදොර නිතරම අපිරිසිදුවේ සිතට භය හා තද තිගැස්සීම් ඇතිවේ විශේශයෙන් හදිසි අනතුරු වලින් ප්‍රවේසම් විය යුතුය දුරගමන් හෝ ගොඩනැගිලි වැඩ වලට බැසිමට අසුබ කාලයකි

සෙනසුරු හෝ කේතු දශා ඇතිඅයට නිවසේ කරදර සහිත කාලයකි නමුත් ගුරු හෝ රාහු දශා අතුරුදශා ඇති අයට යහපත් කාලයකි

ණමුත් පවතින අපල වලට ග්‍රහපූජා බෝධි පූජා ආදිය කරනවානම් වැඩ කටයුතු ආදිය සිතැගි පරිදි සිද්ධවේ කලක් නැවතී තිබුන කටයුතුද නැවත පටන්ගැනේ නොයෙක් කටයුතුවලින් ලාභ ලැබේ උසස් තිලතල හෝ රැකීරක්‍ෂා ආදැයද ලැබෙන්නට පුලුවන ශරීර සෞඛ්‍යය යහපත්වේ ධන ලාභ ලැබේ ආදායමද හොදවේ ව්‍යාපාර කටයුතුවලිනි ලාභ ලබන්නටත් වාසනාවන්ත තත්වයකට හෝ තැනකට යන්නටත් දියුනුවට මග සැලසේ බලාපොරොත්තු දේවල් ආදිය ලැබේ

## අධ්‍යාපනය

සම්මුක පරීක්‍ෂන විභාග ආදී කටයුතු මේකාලයේදී බලවත් උනන්දුවෙන් හා උත්සාහයෙන් යුතුව සාර්තක කරගන්නවා විනා වාසනාවට ලැබේයයි සිතීම නොකලයුතුය

## සෞඛ්‍ය

හදිසි අනතුරු විපත්ති ඇතිවියහැකි කාලයකි ධන හානි ඇතිවේ සැප පහසුව අඩුකරයි ශරීරය දුර්වලවීම හෝ ශරීර ලක්‍ෂනය හා පැහැපත්බව අඩුවේ අසනීපවලට හේතුයි දත්මුල් දියවේ දත් සෙලවෙන්නට ගනී උන ආබෘධ ආහාර නොදිරවීමේ රෝග ලේ දෝෂ සාදනිනට පුලුවන

# කටක ලග්නය

## කරගෙන ආ කටයුතුවල වෙනසක්

## ධනය

කේතු තුන් වැන්නේ ගමන් කරන මේ කාලයේදී බලාපොරොත්තු රහිත ලාභ ලැබේ ධාර්මික ලාභ ලැබේ හොඳ දේ නිපයීමට හෝ සොයා ගැනීමට ලැබේ කරදර සහිතව උවත් සිත් සතුටටද කරුනු සැලසේ මිල මුදල් අතින් යහපත් කාලයකි

**නමුත් පවතින අපල වලට පිලියම් කර ගත්තේ නැතිනම්**

බලාපෙරොත්තු තරමට වඩා තම ආදායම අඩුවෙන බැවින් නය තුරුස් ආදිය ඇතිවීමටද පුලුවන කරගෙන ආ කටයුතුවල වෙනසක් ද ඇතිකල හැක නොතේරුම් කමින් හෝ තමා නොදැනම වැරදි සිදුවේ ධන හානියක්ද ඇතිවන කාලයකි රාහු නවවැන්නේ ගමන් කරන කාලයේදී වියදම සැර වී මිලමුදල් අතින් කරදර ඇතිවේ නිකරුනේ ධන හානි වේ තමාගේ ධනය අනුන් විසින් පැහැර ගැනීම හෝ අනුන්ට දුන් මිල මුදල් ආදිය ආපසු නොලැබීම හෝ නියමයි ආදායම අවහිරවේ

## රැකී රක්‍ෂා

මහන්සියේ තරමට වැටුප් හෝ දක්‍ෂකමේ තරමට තැන නොලැබේ එබැවින් මේ කාලයේදී ඉවසීමත් ලද පමනින් සතුටුවීමත් පුරුදුකර ගැනීම හොදයි උසස් අයගෙන්ද තමාට විපත්ති ඇතිවිය හැකි බැවින් මේ කාලයේදී කල්පනාවෙන් ඒ අය ආශ්‍රය කලයුතුයි ජීවිතයේ අමුතු පරිච්ජේදයක් පෙරලෙන්නටද පුලුවන

## ගෘහ ජීවිතය

**පවතින අපල වලට පිලියම් කර ගත්තේ නැතිනම්** ශනි ලග්නයේ ගමන්කරන කාලය අපල දායකයි නොයෙකුත් ක්‍රමයෙන් විපත්තිද අනතුරුද ඇතිකරයි හදිසි අනතුරු පවා ඇතිකලහැකියි බලාපොරොත්තු රහිත අධික වියදම් සිදුවේ තදලෙසම සිතට කරදර ඇතිවේපවුලේ කෙනෙකුට හෝ ඉතා හිතවතෙකුට තද අපල කාලයකි තමා ගැනද නරකආරංචි පැතිරේ අඳුරට මූල්ලට තල්ලුවී යන ගතියක් දැනෙන්නට පුලුවනතමා සතුදෙය හොරුන් විසින් පැහැර ගැනීමට හෝ අයුතු ලෙස අනුන් විසින් බුක්තිවිදීමට පුලුවන නමුත් මේ කාලයේදී නඩුහබ වලට පැටලුනොත් නිතියේ පිහිට නොලැබී පරාජයටපත්වීමට පුලුවන සොරසතුරන් ගෙන් ඇතිවන අනතුරු වලින් ප්‍රවේසම් විය යුතු කාලයකි දුර පලාත්වල දුෂ්කර මහන්සි සහිත වාහන හෝ පා ගමන් කීපයක්ම යෙදෙනවා ඇත නමුත් ඒවායින් ලොකු ප්‍රයෝජනයක් නොලැබේ මේකාලයේදී කොතරම් පිරිසිදුවට ඇන්දත් ඒවා වහා කිලිටිවේ නිතර ශරීරයේ කුනු ගෑවෙන කටයුතු වල යෙදීමට හෝ එවැනි තැන්වල ආශ්‍රය ඇතිවීමට හෝ හේතු තිබේ බැවින් නිතර කිලිටි හෝ තද රලු ගොරෝසු වස්ත්‍ර අදින කෙනෙක් ලෙස පිට අයට දරශනය වන්නට පුලුවන රුවටීම් වලට පහසුවෙන් අසුවියහැකි කාලයක් නිසා ව්‍යාපාර හෝ විවාහ සහකරුවන් නැතිනම් කොන්ත්‍රාත් කරුවන් හෝ හවුල්කරුවන් සොයිගැනීමේදී මේ කාලය තුල ප්‍රවේසම් වීම හොදයි මවුපිය හෝ වැඩිහිටි ඥාතින්ට යහපත සැලසෙන කාලයකි

## සෞඛ්‍ය

ශරීරසනීපයද යහපත් නොවේ පරන අසනිප මේකාලයේදී නැවත මතුවන්නට පුලුවන නැතිනම් වේදනා ගෙන දෙනසන්ධි ආභාධයක් හෝ පාදයක අමාරුවක් වන්නට පුලුවන

# සිංහ ලග්නය

## නිකරුනේ වියදම්

## ධනය

මුදල් හානිවේ නිකරුනේ වියදම් යන කටයුතු ඇතිවේ සමහර විට දැන දැනම නිෂ්පල දෙයට මුදල් වියදම් කරන්නට සිදුවේ 2005 වසර හා සසඳන විට තරමක මුදල් අඩුපාඩු සහිත කාලයකි

## රැකී රක්ෂා

කරන කියන කටයුතුවලින් කරදරද පාඩුද හාඩා ප්‍රමාදවීම්ද ඇති කාලයකි නිශ්පල ගමන් නිතර ඇතිවේ ප්‍රයෝජන නොලැබෙන දෙයට මහන්සිවෙන කාලයකි කරන රැකියාවේ වැඩකරන ස්තානයේ කරදර නිසා එදිනෙදා කරන කටයුතු කරදර සහිතව කරන්නට සිදුවේ නමුත් අන්තිමේදී හිම්හිට එම කරදර අඩුවීයයි

## ගෘහ ජීවිතය

තද ලෙස කේන්තියයි සිතද නිතරම නරක්වේ තිබුන සම්බන්ධයක් කැඩී බිදී යා හැකියි පවුලේ සමගිය අඩුවේ සතුරන් සමග අවුල් ඇතිවේ මිත්‍රයින්ගෙන්ද කරදර සිදුවේ ඥතියෙකුගේ නැතිනම් ළගම මිතුරෙකුගේ විවාහයත් හෝ තත්වය උසස් වීමක් සිදුවේ නිතර බෝධිපුජා ආදිය කිරීමෙන් හෝ මහාමෘතුංජය වැනි මන්ත්‍රයක් භාවිතා කිරිමෙන් හෝ සෙනසුරු සතෝත්‍රය කියවීමෙන් ජය සැප හා දියුනුව සැලසේ

## සෞඛ්‍ය

කැම බිම පිලිබද නුසුදුසු කමකින්ද නැතහොත් නියම පෝෂ්‍යදායක ආහාර නොලැබීමෙන් හෝ පලාතේ පවතින සීතල හෝ උස්නාධික කමවැනි විෂමතාවයෙන්ද පවුලේ කීපදෙනෙකුම අසනීපවලින් පීඩාවන්නට පුලුවන එම අසනීප අමුතුම අසනීප විය හැක තමාත් සමග එකවැරකීපදෙනෙක්ම අසනීපවන්නට ඉඩ ඇත ඇස්වල හෝ දත්වල ආහාධ වැලදෙන්නට ඉඩ තිබේ ශල්‍ය කර්ම හෝ නැතහොත් බෙහෙත් විදීමක් කරවාලන්නටද සිදුවන්නට පුලුවනි

# කන්‍යා ලග්නය

ගරුනම්බු

## ධනය

මිල මුදල් ලාභ ලැබේ පඩිනඩි හෝ ආදායමද වැඩිවේ ව්‍යාපාර ආදි කටයුතු වලින්ද ජය හා ලාභ ලැබෙන කාලයක් වන නමුත් කේතු ලග්නගතව යන මේ කාලයේදී **පවතින අපල වලට පිලියම් කර ගත්තේ නැතිනම්** අධික වියදම් සහිත හා නාසතියද ඒ හා සමානව ඇතිවන කාලයකි මේ කාලය අනුන්ට නය දීමටවත් අනුන්ගෙන් නය ඉල්ලා ගැනීමටවත් හොද කාලයක් නොවේ තිබෙන දේ පවා නිකරුනේ නැති නාස්තිවී යයි නැතිනම් වේයන් මීයන් ආදි සතුන් හෝ පැමින විනාශකර දමයි වාහන ආදිය තැන් තැන්වල දිරාපත්වීමට පුලුවන

## රැකී රක්‍ෂා

ගෙදරදොර පදි.විය හෝ කාර්යාලීය වෙනසක් තනතුරු ස්තාන වෙනසක් ද සිදුවීමට පුලුවන විෂේශ දියුනුවකට මග පැදීමටද පුලුවන තම තත්වය ඉහලයයි අලුත් තනතුරු රැකීරක්‍ෂා ආදිය මේ කාලය අවසන් වීමට පෙර ලැබෙන්නටද පුලුවන තත්වයට සුදුසු තනතුරු ආදිය ලැබේ වෙනකෙනෙක් මහන්සිවී කල වැඩක පල ප්‍රයෝජන නිරායාසයෙන් නෙලාගැනීමට ලැබෙන කාලයකි තමා කල සේවයේ රක්‍ෂාවේ ප්‍රතිපල හෙවත් එකවර ලැබෙන්නට තිබෙන පඩි මුදල් බෝනස් ආදිය ලැබන්නටපුලුවන් කාලයයි පොත් පත් ආදියෙන් නම ප්‍රසිධ වේ නමුත් කේතු ලග්නයේ ගමන්කරන මේ කාලයේදී පවතින අපල වලට පිලියම් කර ගත්තේ නැතිනම් තමන්ට පැවරෙන කටයුතු හරියට කරගැනීමට අමාරු වේ යයි එක්තරා අන්දමක හිතේ චකිතයක් අස්ථිර හෝ බියජනක ගතියක්ද ඒසමගම ඇතිකරන්නට පුලුවන

## ගෘහ ජීවිතය

ගරුනම්බු ආදියද ලැබීමට පුලුවන තම අදහසට අනුව වැඩ කටයුතු හා ගෙදර දොර කටයුතු සිදුවේ සිතට සැනසීම ගෙන දෙන කාලයකි සිතට නිදහස සැනසීම හා ප්‍රීතිය ඇතිවේ දේපල ගෙවල් ඉඩම් උරුම හිමිකම් ආදිය ලැබෙන කාලයකි සුදුසු වයස නම් විවාහ මංගල්‍ය ආදිය පවා ස්තිර වීමට පුලුවන පවුලේ පිරිස වැඩිවේ නැතිනම් දරු උපත් ආදිය ඇති කාලයකි ගෙදරදොර වාසනාව හා විවාහ මංගල්‍ය ආදියද ප්‍රිය සමාගම්ද ඇතිවේ සමිති සමාගම් වල තනතුරු හෝ කථා පැවැත්වීම් ආදියටද ආරාධනාවන් ලැබෙන්නට ඉඩ ඇත

නමුත් **පවතින අපල වලට පිලියම් කර ගත්තේ නැතිනම්** සහෝදර සහෝදරීආදීන් සමග අමනාප මතුවේ පවුලේ වාදභේධ හෝ වියෝදුක් ඇතිකරන කාලයකි මේ කාලසීමාව තුල තමාට නරක නාමයක් චෝදනාවක් දෝශාරෝපනයක් ලැබෙන්නට ඉඩ තිබෙන බැවින් ප්‍රවේසම් විය යුතුය

## අධ්‍යාපනය

ගුරු දෙවැන්නේ ගමන්කරන කාලයේදී ඥානයද වැඩිවේ එනම් අලුත් අමුතුදේ ඉගනගැනීමට හෝ දැනගැනීමට ලැබේ උසස් අධ්‍යාපනය සදහා විදේශගතවීමට සිතාසිටින අයටද එම බලාපොරොත්තු සාර්තකවීමට පුලුවන

## සෞඛ්‍ය

පවතින අපල වලට ප්‍රතිකර්ම මේ කාලයේදී කරගත්තේ නැතිනම් ඉහත සුබඵලාදිය ලැබෙන අතරම  චර්මාභාධ කැසීම් ලිංගාභාධ හෝ මූත්‍ර අමාරු වකුගඩු අමාරු අර්ශශ් ආදිය ඇතිවිය හැකිය කේතු ලග්නයේගමන් කරන මේ කාලයේදී ශරීරය දුර්වලවේ  මුහුන අවලක්‍ෂන වේ ශරීරයේ තැන්තැන්වල ලප පැල්ලම් හෝ තුවාල සෑදීම හෝ වියලි වැහැරුන ගතියක් ඇතිවීම හෝ සිදුවේ සොර සතුරන්ගෙන් හෝ රැකීරක්‍ෂාවලින් හෝ අසනීපවලින් කරදරයක් සිදුවේයයි සිතට භය සැක ඇතිවේ තද කම්මැලි ගතියක් ඇතිවේ එබැවින් කිසිම ස්තිර වැඩකට බසින්නට සිත නොදේ නිතර නිදාගෙන සිටින්නට හෝ තැන්තැන්වල හාන්සිවී කල්පනා කර කර සිටින්නට කැමතිවේ නිතර ඇනුම් යාමටද හරියට ලොකු මහන්සි ගතියක් ඇතිවෙන්නටද පුලුවනි උන ආභාධ හෝ හිසේ අමාරුවැලදේ පවුලේ අයට දූ දරුවන්ට හෝ මවුපියන්ට හා තමාටද අසනීපාදී අපල ඇති කරයි සිතල හෝ අදුරු තැන්වල වාසය කිරීමට හෝ වැඩ කිරීමටද සිදුවන්නට පුලුවන

# තුලා ලග්නය

### වස්තු ලාභ

## ධනය

වෙලහෙලද ව්‍යාපාර ආදියෙන් හෝ රැකියාවලින් දියුනුව හා උසස්වීම් ඇතිකරන කාලයකි විභාග සම්මුක පරීක්‍ෂන ආදියෙන් ජය ලැබේ වස්තු ලාභ ඇතිකරන කාලයක් නමුත් වියදම් හා ධන හානිද ද ඉතා අධික වේ අලාභහානි හා ලාභ ප්‍රයෝජනද සම සමව ගෙනදෙන කාලයකි ලාභ මෙන්ම නිතරම වස්තු භංගත්වයද ඇතිවෙන නිසා සිතේ ප්‍රීතිය අඩුවේ

## රැකී රක්‍ෂා

අලුත් වැඩ කටයුතු වලට හෝ රැකීරක්‍ෂාවලට බැදෙන්නට හෝ සිදුවන කරුනු ඇති කරන් රාහු භයවැන්නේ ගමන් කරන කාලයේදී ශරීර සනීපය ඇතිවේ ලෙඩදුක් ආදිය තුරන්වී ශරීර සැපය ඇතිකරයි ප්‍රියජනක ස්ත්‍රී පුරුෂාදී ආශ්‍රය ඇතිවේ නමුත් **පවතින අපල වලට පිලියම් කර ගත්තේ  නැතිනම්** නරක ප්‍රතිපල වශයෙන් ඉගනීමේ හා රැකිරක්‍ෂා ආදියේ කටයුතු අතපසුවේ ස්තාන මාරුවීමකටද බොහෝ සෙයින් ඉඩ තිබේ එය රක්‍ෂාව පිලිබද වීමට හෝ පදිංචිය පිලිබදව වීමටද හේතුයි  උසස් අය සමග ආරවුල් හෝ  උසස් අය තමා ගැන අප්‍රසන්න වීමට හෝ හේතු තිබෙන බැවින් ඉතා පරිස්සමෙන් හා නුවනින් යුතුව ක්‍රියා කල යුතු කාලයකි

## ගෘහ ජීවිතය

ශනි 10 වැන්නේ ගමන්කරන කාලය සුභාසුභ මිශ්‍ර පල විපාක ඇති කරන කාලයකි එබැවින් කිසි දෙයක ලොකු හොදක් හෝ ලොකු නරකක් ඇතිවීමට ඉඩක්නැත අලාභහානි හා ලාභ ප්‍රයෝජනද සම සමව ගෙනදෙන කාලයකි දරු ශිෂ්‍ය ලාභ වලට හොදයි නිතරම වස්තු භංගත්වය නිසා සිතේ ප්‍රීතිය අඩුවේ සිත්තැවුල් දුක්

දොම්නස ධන හානි මුදල් හානි ඇතිකරන කාලයකි ශරීරාභාධ සාදන්නටද ඉඩ තිබේ තත්වය පහලට වැටේ කරදරද විපත්තිද ඇතිකල හැකිය වැඩ කටයුතු අධිකවේ පහත්හෝ නරක අයගේ ආශ්‍රයට පැමිනේ නරකසිරිත්විරිත් පුරුදු ඇතිවේ තිබුන ගෞරවයද සැලකිලිද පහතවැටේ පවුලේ වැඩිහිටියෙකුට මාරක අපල කාලයකි දේපල ආදි තම අයිතිවාසිකම් තරකර ගැනීමට වියදම් කිරීමට සිදුවේ නොකල වැරදි වලට පවා දඬුවම් විදින්නට සිදුවිය හැකි කාලයකි සතුරන් ඉර්පියාකාරයන් නිසා සිතට හයක් සැකක් ඇතිව කාලය ගෙවේ කරදර දායකවූද වියදම් අධික වූද නිශ්පල දායක වූද ගමන් නිතර යෙදෙත් ආහාර තිබියදීත් නොකා කුසගින්නේ කාලය ගතකරන්නට සිතෙනවා ඇත

## සෞඛ්‍ය

කේතු දොලොස්වැන්නේ ගමන් කරන කාලයේදී සුලු වශයෙන් තුවාලයක් වත් සැදුනොත් එය නදබල අසාධ්‍ය තත්වයකට වුවද හැරෙන්නට පුලුවන් කාලයකි බොවෙන රෝග ආදියටද පහසුවෙන් පෘත්‍රුවිය හැක ඇස්වල දත්වල පතුල් වල ආහාද හා පිත් කෝප රෝගද වැලදෙන්නට ඉඩ තිබේ පවුලේ අය සමගද මනාප ගති අසමගිකම් ඇතිවේ ඇතැම්විට හදිසි අනතුරු වලට පවා මුහුනදීමට සිදුවේ

## වෘෂ්චික ලග්නය

### වැඩි දියුනුවට කටයුතු නමුත් වැඩිහිටි ඥාතීන්ට අපල

## ධනය

පවතින අපල සදහා ප්‍රතිකර්ම කරගන්නා අයට කේතු එකොලොස්වැන්නේ ගමන් කරන මේ කාලයේදී වැඩි දියුනුවට කටයුතු සැලසේ මිලමුදල් තත්වය උසස්වේ ආදායම් ලැබෙන මාර්ග වැඩිවේ අනාගත ලාභ බලාපොරොත්තුවෙන් මුදල් වියදම්කර යම් යම් වැඩ කටයුතු කරන්නට සිදුවේ නමුත් ඒවායින් ලාභ ප්‍රයෝජන ලැබෙන්නේ තව වසර දෙකක් පමන ගතවූපසුය පවුලේ අයගේ හා දූදරුවන්ගේ දියුනුවට මුදල් වියදම් කිරීමටද කටයුතු සැලසේ ඒවායින්ද මතුවට ප්‍රයෝජන ලැබෙනවා ඇත ධන ලාබද ලැබෙන මුත් එය වහා නැතිවේ සමහරවිට පුන්‍යවැඩවලට හෝ අසරනයන්ට උදවු කරන කාලයකි මේකාලයේදී ගෙවල් ඉඩම් වලට වියදම් කරන මුදල් පසුවට ප්‍රයෝජන ඇතිකරයි

## රැකී රක්ෂා

කරගෙනයන වැඩකටයුතු සාර්තක වේ තමා ඉගනගත්දෙය රටට ප්‍රසිධ වේ තම තත්වය ස්තිර වීමට හෝ තත්වයෙන් උසස්වීමට ඉඩ ලැබේ ශනි 9 වැන්නේ ගමන්කරන කාලයේදී ස්තාන වෙනස් විමක් හෝ ගෙදරින් පිටයාමට සිදුවිමක් හෝ කාර්යාාලීය වෙනසක් හෝ නිතර නිදාගන්නා තැන වෙනස්විමක ඇති කල හැක මහන්සිවි කල වැඩකින් ලාභ ප්‍රයෝජන හා ප්‍රසංසා ලැබෙනවා ඇත නමුත් සතුරන් ඉර්පියාකාරයන් ඇතිවේ කරගෙන ආ කටයුතු වලට බාධා ඇතිවේ දිනපතාකෙරිගෙන ආ තමාගේ වැඩ කටයුතු වෙනස්වේ වෘශ්චික ලග්නයට මෙම

වසර තරමක් කරදර සහිත කාලයකි විශේශයෙන් සෙනසුරු හා ගුරු දශා ඇති අයට කරදරයි

# ගෘහ ජීවිතය

අනිත් දශාඇති අයට එතරම්ම නරක නැත අඩුපාඩු නැතිව ජයට කෑම බීමාදියද ලැබෙන්නට පුලුවන අලුත් ඇඳුම් පැලඳුම් ආහරන වර්ග ලැබෙන්නටද හේතුයි බලාපොරොත්තු රහිත හදිසි ධන ලාබ ලැබේතමාට හෝ තම පවුලේ කෙනෙකුට දරු ලාහයක්ද ලැබෙන්නට පුලුවන දේපල ලාහද වාහන ලාහද ඇතිවිය හැකිය ගෙදර දොර වාසනාව උදාවන කාලයකි අලුත් හිතමිතුරන් මිතුරියන් ආශ්‍රයට ලැබෙනවා ඇත රහස් මිත්‍රසම්බන්දකම් රහස් ගමන් යාමට හෝ ගුප්තවිද්‍යා ආදිය ඉගනීමට හෝ ඉඩ ලැබේ එසේම රහසිගතව යම් යම් දේට මුදල් වියදම් කිරිමට සිදුවේ දේව භක්තිය වැඩිවේ

## එහෙත් පවතින අපල වලට පිලියම් කලේ නැතිනම්

දෙමව්පිය වැඩිහිටියන්ගේ ලෙඩදුක් ආදී කරදර නිසා සිතට දුක් ඇතිවේ සමහරවිටක එවැනි කෙනෙතුට හෝ අන්‍ය හිතවතෙකුට මාරක තරම් අපල ඇතිවිය හැක තිබුන හොඳ නාමය නැතිවේ වියදම් අධික වේ වැඩිහිටියන් ඥාතීන් සමග කරන කටයුතුවලදී නොතේරුම් කමින් හෝ වැරදීම් ඇතිවීමෙන් හෝ අලාබහානි කරදර පාඩු සිත්තැවුල් ආදිය විදීමට සිදුවේ දුර ගමන් යාමට සිදුවේ ප්‍රයෝජනයක් නැති දෙයට උත්සාහ කරන්ටත් වියදම් කරන්නටත් සිද්වේ නොයෙකුත් ක්‍රම වලින් කරදර ඇතිවේ අකරුනාවන්ත කටයුතු අකෘතඥ වැඩ තමා අතින් කෙරෙන සිතෙන කාලයකි සාමාන්‍යයෙන් අවාසනාවන්ත කාලයකි සහෝදර සහෝදරියන් සමග විරුධ විමද ඔවුන්ට අපලද නියමයි දුරදිග නොබලා ඉක්මන් කමින් කරන කතාවෙන් ආරවුල් මතුවේ සමගියෙන් සිටි පවුලක් හෝ කෙනෙක් විරුධවේ ධන හානි සිත් කරදර ලෙඩ රෝග පාඩු අලාභ අවාසනාවන්ත ස්තාන මාරු හො වෙනස්වීම් ආදිය ඇතිවිය හැකි නිසා මේ කාලය තුල බොහෝ දුරට ඉවසිලි වන්තව සිටීම නුවනට හුරුයි

# සෞඛ්‍ය

රාහු පස්වැන්නේ ගමන් කරන කාලයේදී හිතට කරදරද කයට දුක් පීඩාද ඇතිකරයි වෙහෙස ඇති කරදර කාරී ගමන් යාමට සිදුවේ දරු ශිශ්‍යාදීන්ට අසනීප කරදර හෝ අපල අපදුව ඇතිකරන කාලයකි ආශ්‍රයද අඩුවේ හෝ ඇත්වේ උදරාබාධයකටද හේතුයි

# ධනු ලග්නය

## සිත් කරදර හා බර වැඩ

# ධනය

කේතු දසවැන්නේ ගමන් කරන කාලයේදී තමාගේ ගේදොර වතුපිටි ඉඩකඩම් දියුනු කරගැනීමට ගන්නා උත්සාහයන්ගෙන් හොඳ ප්‍රතිපල ලැබේ බර වැඩ කටයුතු වලට බසින්නට සිදුවේ සාමාන්‍ය ආදායමද ලැබේන අතර උත්සාහය වැඩිවූ තරමට ප්‍රතිපලද ලැබේ

## රැකී රක්ෂා

රක්ෂාවෙන් තරමක් හොද වුවත් වියදම් පක්ෂයද ඉහල යන්නට පුලුවනි කේතු 10 වඅන්නේ ගමන්කරන මුල් මාස 9 තුල දියුනුවටත් සිත් සතුට ඇතිවිමටත් රැකී රක්ෂාවලින් යහපත සිදුවීමටත් ඉඩ තිබෙන නමුත් අග මාස 9 තුල සතුරු පීඩාද අසනීපද උත්සාහයන් ගේ ප්‍රතිපල අඩුවිමද ආදී අපල ගෙනදෙන්නට පුලුවන 2006 දී ගතවනුයේ අග මාස 9 නිසා රැකිරක්ෂා කටයුතු වලට කරදරයි

## ගෘහ ජීවිතය

**පවතින අපල වලට පිලියම් කලේ නැතිනම්** පියාට හෝ පියපක්ෂයේ වැඩිහිටියෙකුට නැතිනම් වැඩිමල් දරුවාට අපල දායක කාලයකි නරක පහත් අයගේ ආශ්‍රය හෝ එවැනි අය ගෙන් තමාට කරදර පාඩු නින්දා ආදිය ඇතිවිමට පුලුවන පදිංචි ස්තානය වෙනස් විය හැකියි නොයෙකුත් ක්‍රම වලින් සිත් කරදර කනගාටු ඇතිවේ නුවමනා හිරිහැර වලට අසුවේ ක්‍රමානුකූල ජීවිතයක් ගෙනයාමට නොලැබේ හදිසි අනතුරු හා විපත්ති සහිත හෝ අවනම්බුව ලැබෙන කාලයකි තත්වය පහල වැටේ ගෞරවය නැතිවේ හයෙන් කාලය ගතවේ ආශ්‍රය කරන්නන්ගෙන් බරපතල ලෙස කරදර සිත්තැවුල් ඉර්ෂියාකාර කම් හෝ තම කටයුතු වලට හාධාකිරීම් ඇතිවිය හැක ජීවිතයේ එක් අවාසනාවන්ත අමුතුම කාල පරිච්ජේදයකි

රාහු සිවුවැන්නේ ගමන් කරන කාලයේදී හිතට කරදරද කයට දුක් පීඩාද ඇතිකරයි පවුලේ අයගෙන් ඥාති මිත්‍රාදීන්ගෙන් ඇත්වීමහෝ ඒ අයට අපල ඇතිකරයි වෙහෙස ඇති කරදර කාරී ගමන් යාමට සිදුවේ තිබුන වස්තුව අහිමිවේ ඇතැම්විට සිතට සැක ඇතිව සැම දෙයක්ම කරන්නට සිදුවේ අවුල් වියවුල් නඩු පැටලිලිහෝ හෘදයේ තද තිගැස්සීම් හය කම්පාවීම් ඇතිකරයි අනතුරු හිරිහැර ආදියට මුහුනදෙන්නට සිදධවිය හැකි කාලයක් නිසා ප්‍රවේසම් විය යුතුය පදිංචිය පිලිබද කරදරද ඇති කලහැක නමුත් උගත් අයගෙන් ඒවා විසදාගැනීමට පහසු උපදේශ හා උපකාර ලැබෙනවා ඇත තදකරදර ඇතිවුවත් ඒවායින් පහසුනේ නිදහස් විමට අනුන්ගෙන් උපකාරද ලැබේ

### උපතේදී සෙනසුරු සිටි තැන අනුව

උත්පත්තියේදී ශනි තුන්වැන්නේ සිටි අයටද සහෝදර සහෝදරින්ට අපලදායක කාලයකි තමන්ටද ගමන්වලන් අනතුරු ඇතිවිය හැකිනිසා ප්‍රවේසම් වියයුතුය උත්පත්තියේදී ශනි දෙවැන්නේ සිටි අයටද ධන හානිද පවුලේ අවාසනාවන්තකම්ද මතුවේ උත්පත්තියේදී ශනි අටවැන්නේ සිටි අයට එතරම් තදබල විපත්ති ඇතිනොවේ නමුත් දුක් සහිතව කාලය ගතකරමින් යහපත් දෙයක් අවබෝධකරගනිමින් හෝ යහපත් වැඩකට උත්සාහ කරමින් කාලය ගතකරන්නට සිදුවේ නමුත් එක්තරා ආකාරයක තනි ජීවිතයක් දුකසේ රහසිගතව ගෙනයනවා ඇත කෑම බීම අතින් අඩුපාඩුද මුදල් අතින් දුෂ්කර කම්ද ඇතිවෙත් නමුත් අන්තිමේදී ලොකු යහපතකට කටයුතු ඇතිවේ

## සෞඛ්‍ය

ශනි 8 වැන්නේ ගමන්කරන කාලයේදී ශරීර පීඩා අසනීප හෘදයාබාධ ලේ දෝෂ අර්ෂස් ආබාධ ලේ හිගවීම ලේ විෂවීම මලපහවීමේ දෝෂ බෝවෙන රෝග ආදී අසනීප සැදෙන්නට පුලුවන එය සමහරවිට තමාට හෝ තම පවුලේ අයට සැදෙන්නට ඉඩ තිබේ උත්පත්තියේදී ශනි ඉතා බලවත් වූ අයටද ශනි අට වැන්න

අධිපතියා වූ අයටද 8 වැන්නේ සුභ දෘසි ලත් අයටද ඉහතකී තදබල අපල අඩුවේ සෑම කරදරයකම අගදී තරමක සැනසිලිදායක ගතියත් ඇතිවේ

# මකර ලග්නය

## ප්‍රීතිමත් ගමන් බිමන්

## ධනය

රාහු තුන්වැන්නේ ගමන් කරන කාලයේදී ආදායම වැඩිවේ මිත්‍රයන්ගෙන් උපකාරද සැලකිලිද ලැබේ අත්හැර දමා තිබූ වැඩකටයුතු නැවත අලුත්වීමෙන් දියුනුවද තම බලය වැඩිවීමද අසල්වැසියන්ගෙන් ලගඥාතීන්ගෙන් හා දුරබැහැර සිටින මිත්‍රයන්ගෙන් උපකාර ලැබීමද ප්‍රීතිමත් ගමන් බිමන් නිතර යෙදීමද පරන වැඩකටයුතු නැවත පටන් ගැනීමට ඉඩ පහසුකම් ලැබීමද සමාජයෙහි තැනක් ලැබීමද මේකාලයේ සිද්ධුවන්නට පුලුවන

## රැකී රක්‍ෂා

රැකීරක්‍ෂාවලින් උසස්වීමට හෝ අමුතුවෙන් රක්‍ෂාවක් සොයාගැනීමට උත්සාහ කරන කාලයකි නමුත් උත්සාහයේ තරමට ප්‍රතිපල අඩුවේ රැකීරක්‍ෂා වලින් මෙකාලයේදී පහල වැටුනොත් නැවත ඒ තත්වයට නැගීසිටීමට ගන්නා උත්සාහයන්ගේ ප්‍රතිපල හීන වියහැකි නිසා කරන කියන රැකීරක්‍ෂා කටයුතු දියුනුකර ආරක්‍ෂාකරගැනීමට උත්සාහකලයුතු කාලයකි

## ගෘහ ජීවිතය

අත්හැර දමා තිබූ වැඩකටයුතු නැවත අලුත්වීමෙන් දියුනුවද තම බලය වැඩිවීමද අසල්වැසියන්ගෙන් ලගඥාතීන්ගෙන් හා දුරබැහැර සිටින මිත්‍රයන්ගෙන් උපකාර ලැබීමද ප්‍රීතිමත් ගමන් බිමන් නිතර යෙදීමද අමුතුවේ පරන වැඩකටයුතු නැවත පටන් ගැනීමට ඉඩ පහසුකම් ලැබීමද සමාජයෙහි තැනක් ලැබීමද මේකාලයේ සිද්ධුවන්නට පුලුවන

**පවතින අපල වලට පිලියම් කලේ නැතිනම්** ශනි 7 වැන්නේ ගමන්කරන මේ කාලයේදී නිතර ගමන් බිමන් ඇතිවීම නිසා කරගෙන යන කටයුතුවලට බාධා හා ප්‍රමාදවීම් ඇතිවේ පවුලේ අයගෙන්හෝ තම සහකරුගෙන් ඈත්වීමට හෝ නැතිනම් පවුලේ අයට අසනීප කරදර ආදියත් වෙහෙස ඇති දුරගමන් යෙදීමටත් හේතුයි වියදම් අධික කරයි මහජනයා සමග කරන කටයුතුවලදී අවුල් වියවුල් මතුවේ රහස් සම්බන්ධකම් හෝ අමුතු කම්සැප ලැබේ බොරුචෝදනා නඩුහබ හෝ පැමිනිලි ඇතිකරයි නිස්පල ධන හානියකට හේතුයි කායික චෛතසික පීඩා ඇතිකරයි හුන් තැනින් ඉවත්වීමට හෝ පහතවැටීමට සිදුවේ තදලෙස සිත් කම්පාවීමට කටයුතු යෙදේ කරගෙන යන සිතේ සැනසීම අඩු කාලයකි රාහු තුන්වැන්නේ දුර්වලව ගමන් කරන කාලයේදී සහෝදර පක්‍ෂයෙන් තම සිත් තැවුල් උපදවන කටයුතු ඇතිවේ කරන කියන කටයුතු අවුල් සහිතව කෙලවර වේ එසේම අසල් වැසියන්ගෙන්ද තම මස්සිනා වරුන්ගෙන්ද එසේ නැත්නම් අන්‍ය ආශ්‍රය කරන්නන්ගෙන් හෝ තමාට කරදර හේතුවන කටයුතු ඇතිවේ පවුලේ කෙනෙකුට විපත්ති දායක කාලයකි තමාටද ගමන් අනතුරු ඇතිකලහැකියි

## සෞඛ්‍ය

හිරිවාතාදී ආහාදද ලිංගාහාධ හිරිවාත අජීර්න රෝග වැලදෙන්නට ඉඩ තිබේ ශරීරයේ සෙම් පිත් ආදියෙහි අසමානකම් තුන්දොස් කෝප ඇතිවේ කායික දුර්වලත්වය නිසා සිත් සැනසීම අඩුවේ

# කුම්භ ලග්නය

### පවුලේ සමගිය හා වාසනාව

## ධනය

ධන ලාබ ලැබේ මිලමුදල් ලාභ ඇතිකරන කාලයකි අලුත් තත්වයක් ඇතිවේ ආදායම් වැඩිවීමටද ඉඩතිබේ ගෙවල් ඉඩම් හෝ ඒවා සෑදීමට අවශ්‍ය උපකරන හෝ ගෘහභාන්ඩාදිය පහසුවෙන් ලැබෙනවා ඇත අලුත් ආදර බන්ධන ඥාති සබඳකම් ආදිය ඇතිවියහැකි කාලයකි නමුත් වියදම අධික වේ

## රැකී රක්ෂා

ශරීරය වෙහෙසකරන ගමන්බිමන් හෝ වැඩ කටයුතු නිතරපාහේ හෝ දිනපතාම ඇතිවේ විභාග හෝ සම්මුඛ පරීක්ෂන ආදියෙන් ජයවේ පිටපලාත් වලදී කරන කටයුතු වලින් සහ පිටපලාත්වල අය සමග කරන ගනුදෙනු වලින් ලාභ ප්‍රයෝජන ලැබේ පූජකයන්ගෙන්ද අන්‍ය ආගමිකයන්ගේද අන්‍ය ජාතිකයන්ගේද ආශ්‍රය ඇතිවීමත් ඔවුන්ගෙන් උපකාර ලැබීමත් නියමයි උසස් ධර්ම ශාස්ත්‍ර ගැන දැනීමක් ලබාගැනීමට ඉඩතිබේ අන්‍ය භාෂාවන් පවා මේකාලයේදී ඉගනීමට සිත්දේ

## ගෘහ ජීවිතය

ප්‍රීතිමත් දුරබැහැර ගමන් හෝ වන්දනා ගමන් ආදිය යාමට සිදුවේ ගෙදරදී හෝ පිටදී ආගමාක කටයුතුවලට මැදිහත්වන්නට සිදුවේ පවුලේ සමගියත් පවුලේ අයගෙන් උපකාරත් ලැබේතදලෙස දුරගමන් බලපවත්වන කාලයකි පියාට හෝ පියපක්ෂයේ ඥාතීන්ට යහපත් කාලයකි පිටපලාත්වල වාසයට හෝ ආශ්‍රයට යාමට හොදම කාලයි දරු ශීෂ්‍ය ලාභ මිලමුදල් ලාභ ඇතිකරන කාලයකි අලුත් තත්වයක් ඇතිවේ ආදායම් වැඩිවීමටද ඉඩතිබේ ගෙවල් ඉඩම් හෝ ඒවා සෑදීමට අවශ්‍ය උපකරන හෝ ගෘහභාන්ඩාදිය පහසුවෙන් ලැබෙනවා ඇත අලුත් ආදර බන්ධන ඥාති සබඳකම් ආදිය ඇතිවියහැකි කාලයකි

ශනි 6 වැන්නේ ගමන්කරන කාලයේදී සතුරන්ගෙන් ජය ලැබේ සතුරන් පරාජය කලහැකි කාලයකි ස්ත්‍රී පුරුෂ හිතවතුන් හිතවතියන් සමග ආශ්‍රය ඇතිවේ දේපල දියුනුවේ වාසනාවන්ත ප්‍රීතිමත් කාලයකි දියුනුවට කටයුතු සැලසේ හොද ආහාරපාන හා සැප පහසුවට අවශ්‍ය ඇඳපුටු බඩු බාහිරාදිය හා වාහන මිලදීගන්නට ලැබේ

## සෞඛ්‍ය

ලෙඩරෝග ඇතිනම් ඒවායින් සුවය ලැබේ ශරීරයේ පෙනුම හොදවේ නමුත් කේතු අටවැන්නේ ගමන් කරන කාලයේදී අසනීප තුවාල ආදිය ඇතිකල හැකි කාලයක් නිසා ප්‍රවේසම් විය යුතුය

# මීන ලග්නය

## නිතර ඇවිදිලි

## ධනය

තම දියුනුව සදහා කරගෙන ආ වැඩපිලිවෙල හෝ ලැබෙමින් තිබූ ආදායම් ප්‍රමාදවන ගතියක් ඇති කරයි  නම්බුවද නැතිවීමට ඉඩ ඇතිබැවින් කල්පනාකාරීව අගති වැඩ කටයුතු නොකල යුතු කාලයකි තමන්ගෙන් ඉල්ලාගත් දෙය පවා ආපසු නොලැබේබොරු චෝදනා ලැබෙන්නට පුලුවන සොරුන්ගෙන්ද හය ඇති කරයි රාත්‍රී ගමන් වලින් වැලකීම හොදයි

## රැකී රක්ෂා

රාහු දුර්වලව ලග්නයේගමන් කරන කාලයේදීගමන් බිමන් අධිකවේ එකතැනක සිටීමට අකමැතිවේ නිතර ඇවිදීමටහිත දේ ජීවිතයේ අමුතුකාල පරිච්ජේදයක් උදාවීමට පටන් ගැනේඅමුතු අනාගතයකට මුහුනදෙන්නට සිදුවේ වැඩ කටයුතුවලින් කරදර හා අවිවේකයද ඇතිවේ

## ගෘහ ජීවිතය

ශනි 5 වැන්නේ ගමන්කරන කාලයේදී බලාපොරොත්තු අදහස්ද අනුන් සමග වූ පොරොන්දු ගිවිසුම් ආදියද වෙනස්වීමට ඉඩ ඇති කාලයකි පහසුනේ බේරුමක් කර ගතහැකිව තිබූ අවුල් වියවුලු ආදිය පිලිබදව ලොකු කරදර වලටද පැටලිලිවලටද පත්වේ සුලුදේ ලොකුවට පත්වීමෙන් අමාරුවට වැටේ මේවා වැඩිපුර සිදුවන්නේ හිත දමනය කරගැනීමට නුපුලුවන්කම නිසාය සුලුවරදනිසා ලොකු දඩුවම් ලැබෙන කාලයකි කේතු හත්වැන්නේ ගමන් කරන කාලයේදී ගෙදර අය හෝ අසල්වැසියන් සමග අවුල් වියවුල් ඇතිවේ නොතේරුම් කමින් හෝ මෝඩ කම්වලින් ඔවුන් සමග විරුධ වීම නියමයි මිතුරන් සමගද ආරවුල් ඇතිවිය හැක සිත් තැවුල් ඇතිවීමට හේතු වන කරුනු සිදුවේ තමපවුලේ අයට අසනිප කරදර හෝ තදබල අපල ඇතිකල හැකි කාලයකි කරදර සහිත කාලයකි ඇවිදිලි වැඩිවේ බඩේ අසනිපයක් සැදේ පවුලේ දරු ලාභද ඇතිවිය හැකි කාලයකි අධික වියදම් සහිතය සිතට හය ඇතිවන කාලයකි දරු ශිෂ්‍යයන් නිසා අධික වියදම් දරන්නට සිදුවේ අනුන්ට ප්‍රකාශ කල නොහැකි අවාසනාවන්තකම් අඩුපාඩුකම් ඇතිවේ තම දරුවන්ටද අපල කාලයකි

## සෞඛ්‍ය

තමාට හෝ පවුලේ අයට විපත්ති කරදර මාරක හය ආදී අපල ඇතිකරන කාලයකි අර්ශස් ආහාධ හෝ  එවැනි ගුදමාර්ග ආබාධ සැදෙන්නට ඉඩතිබේ නිතර කයට වෙහෙස මහන්සි ගතියක් ශක්තිය අඩු ගතියකි හෝ අසනීප ගතියක් දැනේ

හදිසි අනතුරු වලින් පරිස්සම් වියයුතුය ශරීරයේ තුවාල හෝ අර්ශස් ආදී රෝගයක් මතුවිය හැකි කාලයකි ගමනින් තද වෙහෙස ඇතිවේ ළගම ඥාතියෙකුට හෝ පවුලේ අයෙකුටද ඉතා අපල කාලයකි වසංගත රෝග පවා සැදීමට පුලුවන් කාලයකි  යටිබඩේ හෝ ඇස්වල ආබාධ සෑදෙයි ශරීරාභාධ ගැනත් සැලකිලිමත්ව සිටිම හොදයි  කෑම නොදිරවීමේ ආහාධ හෝ ආහාර ගැනීමට අප්‍රිය ගතියක් ඇතිවේ සිතට භය සහිතව කාලය ගතකිරීමට සිදුවේ හමේ දෝශ කැසීම් වැනි ආහාධ ඇතිවේ පවුලේ අය සමගද ආරවුල් ඇතිවිය හැකි බැවින් ඉවසීමෙන් ක්‍රියාකල යුතුයි